**ගොඩකවෙල ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 23 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

සමාලෝචිත වර්ෂයට අදාලව 2017 වර්ෂයේදී ගෙවන ලද රු. 35,625 ක වියදම් වර්ෂයේ වියදම් සහ ණයහිමියන්ට ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් සහ ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 ගෙවියයුතු ගිණුම්**

**------------------**

දොරින් දොරට ගමින් ගමට ආර්ථික සංවර්ධනය සඳහා වූ ජාතික සැලැස්ම යටතේ 2014 වර්ෂයේදී සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති 08 ක් සඳහා එකතුව රු. 9,597,505 ක්

සභාව විසින් ගෙවීම් කල යුතු වුවත් 2016 නොවැම්බර් 11 දින වනවිටත් අදාල වගකීම් පියවා නොතිබුණි.

**1.3.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි අංක 446(2) | මුදල් පොත දිනපතා තුලනය කලයුතු වුවද, සභාව විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත් දෙක එසේ දෛනිකව තුලනය කර නොතිබුණි. |
| (ආ) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 සහ 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන චක්‍රලේඛය | සභාව සතු වාහන කිසිවක රාජ්‍ය ලාංඡනය සහ සභාවේ නම යොදා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | |
| | IV (ආ) කොටසේ අංක 05 යටතේ ඇති අතුරු ව්‍යවස්ථාව | අනවසර ඉදිකිරීම් ලේඛනයේ සඳහන් ඉදිකිරීම් 10 ක් සම්බන්ධයෙන් 2016 අප්‍රේල් වනවිට එම ඉදිකිරීම් ඉවත් කරගන්නා ලෙසට හෝ නීත්‍යානුකූල කර ගන්නා ලෙසට දැන්වීම් යැවීම පමණක් සිදුකර තිබුණි. නියම කරන ලද කාලයෙන් පසුව අයිතිකරු විසින් අවශ්‍ය කටයුතු කරනු |

නොලැබුවහොත් එම අනවසර ඉදිකිරීම ඉවත් කිරීමට සැලැස්විය යුතු වුවද, 2017 ජනවාරි 31 දින වනවිටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 12,889,563 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 8,932,743 ක් වූ බැවින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 3,956,820 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලය රු. 3,956,820 කින් වැඩිවීම කෙරෙහි ආදායම් විෂයයන් 02 ක රු. 4,229,721 ක වර්ධනය හා වියදම් විෂයයන් 02 ක රු. 2,328,677 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 2,912 | 6,872 | 2,948 |
| බදු කුලී | 8,444 | 6,274 | 370 |

| | | | |
|---|---|---|---|
| බලපත්‍ර ගාස්තු | 1,169 | 988 | 58 |
| වෙනත් ආදායම් | 48,257 | 42,050 | 14,085 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බදු කුලී ආදායම්, සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ සහ රජයේ දායකත්වය පිළිවෙලින් සියයට 25 ක්, සියයට 43 ක්, සියයට 63 ක් හා සියයට 16 ක් වශයෙන් විශාල ලෙස අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

### 2.3.3 වරිපනම්

---------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයට අයත් දේපල සම්බන්ධයෙන් වූ 2014 දෙසැම්බර් 03 දිනැති තක්සේරුව මත 2016 වර්ෂයේදී යැවූ වරිපනම් දැන්වීම් පිළිබඳ පුද්ගලයින් 57 දෙනෙකුගෙන් විරෝධතා ලැබී තිබුණි. ඒ අනුව, 2011 වර්ෂයේ සිට හඳුනාගෙන තිබූ වරිපනම් බල ප්‍රදේශයට අයත් දේපල සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය වනවිට වසර 05 ක් ගතවී තිබුණද, වරිපනම් බදු අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු. 1,749,500 ක හිඟ වරිපනම් ශේෂයක් පැවතුණි.

### 2.3.4 බදුකුලී

-------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947 හා 2015 දෙසැම්බර් 23 දිනැති ගැසට් පත්‍රය අනුව සර්කස් සංදර්ශන හා සංගීත සංදර්ශන වල ටිකට්පත් වල විකුණුම් මිලෙන් සියයට 15 ක් විනෝද බදු අයකල යුතු වුවත්, සභා බල ප්‍රදේශය තුල පවත්වන ලද සර්කස් සංදර්ශනයකින් රු. 79,200 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.

(ආ) සෑම වර්ෂයකම අක්කර බදු පනවා අයකිරීම් සම්බන්ධයෙන් ගැසට් කිරීම් සිදුකර තිබුණද, අයකිරීම් නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් 2016 සැප්තැම්බර් 30 දින වනවිට ඉකුත් වර්ෂයන්ට අදාලව රු. 62,312 ක් හා, සමාලෝචිත වර්ෂයට අදාලව රු. 13,903 ක් අයවිය යුතුව තිබුණි. එය ඉකුත් වර්ෂයේ අවසානයට පැවති හිඟ ශේෂයට වඩා සියයට 22 ක වර්ධනයක් විය.

### 2.3.5 බලපත්‍ර ගාස්තු

---------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947 හා 2015 දෙසැම්බර් 23 දිනැති ගැසට් පත්‍රය අනුව 2016 වර්ෂය සඳහා ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හා බලපත්‍ර ගාස්තු අය කිරීමේදී සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන ගැසට් පත්‍රයේ සඳහන් සෑම ව්‍යාපාරයකින්ම/ කර්මාන්තයකින්ම බදු හා ගාස්තු අය කල යුතු වුවද, එලෙස බදු ගාස්තු අයකල යුතු ස්ථාන හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

### 2.3.6 වෙනත් ආදායම්

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1986 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් සහ ගොඩනැගිලි නියෝගයන්ට කරන ලද සංශෝධනයන්හි V වන උපලේඛනය පරිදි දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේදී අයකල යුතු ගාස්තු වලට පටහැනි ලෙස ආයතන 04 කින් රු. 489,825 ක් අඩුවෙන් අයකර තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල 2015/2016 වර්ෂයන් තුලදී ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු වලට අදාලව ආයතන 05 කින් එකතුව රු. 165,500 ක් 2017 මාර්තු 10 දින වනවිට සභාවට අයවිය යුතුව පැවතුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix)(ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණද, 2016 නොවැම්බර් 10 දින වනවිටත් කසළ ශෝධනය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයවිය යුතු රු. 8,824,687 ක් වූ උසාවි දඩ මුදල් 2016 ඔක්තෝබර් 21 දින වනවිට පළාත් භාණ්ඩාගාරය වෙත ලැබී තිබුණද, එකී මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට 2017 මැයි වනවිටත් සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2016 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු. 7,677,721 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට හා රත්නපුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2016 වර්ෂය වෙනුවෙන් අදාල උපලේඛන ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කාර්යසාධනය**

**---------------**

2016 වර්ෂයේ අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන වියදම් වශයෙන් භෞතික සැලසුම්, මංමාවත් සහ ඉඩම් හා ගොඩනැගිලි යටතේ හඳුනාගත් ව්‍යාපෘති 24 ක් වෙනුවෙන් එකතුව රු. 5,100,000 ක් ඇස්තමේන්තු කර අනුමැතිය ලබාගෙන තිබුණද, ඉන් ව්‍යාපෘති 15 ක් 2016 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. තවද, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/01/2016 හා 2016 ජනවාරි 18 දිනැති ලිපියෙහි සඳහන් උපදෙස් පරිදි ඉදිරියේදී කරනු ලබන සංවර්ධන වැඩ සටහන් සඳහා අදාල අනුමැතිය කොමසාරිස්/ලේකම් මඟින් ලබා ගැනීමෙන් පසුව සිදුකල යුතු බවට දැනුම් දී තිබුණද, සභාව විසින් 2016 අගෝස්තු සිට 2016 දෙසැම්බර් දක්වා අනුමැතියට යවා තිබුණු රු. 7,663,636 ක් වූ කර්මාන්ත 06 ක් සඳහා අවශ්‍ය අනුමැතිය 2016 දෙසැම්බර් 31 දින වනවිටත් ලබාදී නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

සභාවට අයත් බලවින්න ගොවිපලේ ආරක්ෂාව සහ පාලනය පහසුකර ගැනීම සඳහා එම බිමෙහි මුරකුටියක් සහ ගබඩා කාමරයක් ඉදිකිරීම සඳහා වූ රු. 621,651 ක ඇස්තමේන්තුව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීම පිණිස යොමු කර වර්ෂ 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගත නොහැකි වී තිබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

අංක 1907/50 හා 2015 මාර්තු 27 දිනැති ගැසට් නිවේදනයට අනුව සභාවේ ධුර කාලය 2015 මැයි 15 දිනෙන් අවසන් වී තිබුණද, සභිකයින් 14 දෙනෙකු වෙනුවෙන් 2015 මැයි මාසයට අදාල සම්පූර්ණ සභික දීමනාව ලෙස එකතුව රු. 220,000 ක් හා සම්පූර්ණ ඉන්ධන දීමනාව ලෙස එකතුව රු. 70,000 ක් වශයෙන් රු. 290,000 ක් ගෙවා තිබූ නිසා රු. 145,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

## 3.4 සන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් කසළ බැහැර කරන ස්ථානයේ කපන ලද විශාල වලකට කසළ බැහැර කර දින 03 කට වරක් කසළ වල කැපීමේදී ඉවත් කරනු ලබන පස් දමා වැසීමක් සිදු කරමින් තිබුණි.

(ආ) කසළ බැහැර කරන ස්ථානය සභාව සතු ඉඩමක් නොවූ අතර, එම ඉඩම සභාවට පවරා ගැනීමේ කටයුතු මන්දගාමී ස්වභාවයක පැවතුණි. කසළ බැහැර කරන ස්ථානය සඳහා ලබාගත යුතු පරිසර බලපත්‍රය ලබාගැනීමට අදාල පාරිසරික නිර්දේශය 2013 සැප්තැම්බර් 13 දින ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අදාල නිර්දේශ ක්‍රියාත්මක කර පරිසර බලපත්‍රය ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. මේ හේතුවෙන් වර්ෂ කිහිපයක සිට පරිසරයට අහිතකර ලෙස බලපාන අයුරින් කසල බැහැර කිරීම සිදුවෙමින් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

**අයවැය පාලනය**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 25 කට අදාලව එකතුව රු. 3,453,500 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 25 කට අදාලව එකතුව රු. 3,666,072 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 45 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් පැවතුණි.

## 5. පද්ධති හා පාලනය

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) | උපලේඛන ඉදිරිපත් නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | කසළ බැහැර කිරීමේ ක්‍රමවේදය පරිසර හිතකාමී නොවීම |